**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය - 2022**

**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ (“මණ්ඩලය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2019 අංක 23 දරන ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 10(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතියේ (SLFRS for SMEs) වගන්ති 10.15 සිට 10.18 දක්වා විධිවිධාන අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් භාවිතා කරනු ලබන වත්කම්වල ඵලදායී ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට, ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීමට හෝ වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. එහෙත් මණ්ඩලය විසින් රු. මිලියන 4.71 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් අගය සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ විස්තරාත්මක උපලේඛනයෙන් සහ ස්ථාවර වත්කම් ලේඛනයෙන් සාවද්‍ය ලෙස ඉවත් කර තිබුණි. මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් කේතනය කිරීමට හා වර්ෂ 3 කින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමටද කටයුතු කර නොතිබුණි. තවද නියැදි විගණන පරීක්ෂාවකදී හඳුනාගත් පරිදි | ගිණුම් වාර්තාවල දක්නට ලැබෙන සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් අයිතම 2022.12.31 දිනට භෞතිකව ලබා ගත හැකි අයිතම සහ භෞතිකව ලබා ගත නොහැකි අයිතම වශයෙන් දෙකොටසකි. මේ සියල්ල ජර්නල් සටහනක් මඟින් බැහැර කිරීමක් ලෙස පෙන්වීමට කටයුතු කරන ලදී.<br>කෙසේ වෙතත්, ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් පත් කරන ලද අභ්‍යන්තර සමීක්ෂණ මණ්ඩලය භෞතික සත්‍යාපනයක් සිදු කර ඇති අතර, වත්කම් අයිතම සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් දැනට භාවිතා කරන වත්කම් අනාගත ප්‍රයෝජනවත් ආර්ථික ජීවිතය සලකා බලා නැවත තක්සේරු කර SMEs සඳහා SLFRS හි 10.15 | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් භාවිතා කරනු ලබන වත්කම්වල ඵලදායී ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට, භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට සහ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයට අයත් ප්‍රොජෙක්ටරයක් සහ ශීතකරණයක් මූල්‍ය ප්‍රකාශනවලට සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. මෙම කරුණු හේතුවෙන් වත්කම්වල ආරක්ෂාව හා කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | සහ.10.18 යටතේ අපේක්ෂා කරන පරිදි ගිණුම් වාර්තා වෙත ගෙන එනු ඇත. මෙම අභ්‍යාසය 2023 වර්ෂය තුළ අවසන් කෙරෙනු ඇත. | |
| (ආ) | මණ්ඩලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට වසර 30 ක කාලයක් සඳහා වටිනාකම රු. මිලියන 1.68 ක වාර්ෂික බදු කුලියකට පර්චස් 30 ක ඉඩමක් 2021 දෙසැම්බර් 29 වන දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එළඹි ගිවිසුමක් මගින් ලබාගෙන තිබුණි. මෙම ඉඩම සඳහා 2022 වර්ෂයට අදාළව මෙහෙයුම් බදු (Operating Lease) යටතේ බදු කුලිය ගෙවමින් පැවතියද සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතියේ (SLFRS for SMEs) 20.16 ඡේදයට අනුව වර්ෂයක් ඇතුලත, වර්ෂ එකත් පහත් අතර හා වර්ෂ 5 ට වැඩි කාල පරාසයන් තුල ගෙවිය යුතු කුලිය, වර්ෂය තුල ගෙවූ කුලිය සහ කුලී ගිවිසුම යටතේ වන සීමා කිරීම ආදී තොරතුරු සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.<br>තවද, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇති කරගත් බදු ගිවිසුමේ 1.9 වගන්තියේ සඳහන් පරිදි වසර දෙකක් තුල නව ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකල යුතු වුවද ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2023 මැයි 31 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. | ලබන වසරේ සිට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ප්‍රමිතීන් සඳහා SLFRS හි 20.16 (C) ඡේදය අනුව අවශ්‍ය හෙළිදරව් කිරීමට භාරගෙන ඇත. | ගිණුම්කරන ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මාස 03 ට වඩා වැඩි කාලයක් ගතව තිබූ නමුත් අයවී නොතිබුණු රු.මි.1.89 ක් වූ ණයගැතියන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බොල්ණය හා අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණු අතර එය මණ්ඩලයේ ප්‍රතිපත්තිය අනුව බොල්ණය වෙන් කිරීම බව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබුණි. | අයකරගත නොහැකි ණය කපා හැරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය විශේෂිත වේ. ඇතැම් ණය එකතු කිරීමට දිගු කාලයක් ගත වුවද අපගේ සියලුම ණය අයකරගත හැකි බැවින් සහ භාවිතයක් ලෙස අපි සැක සහිත | බොල්ණය හා අඩමාණ ණය වෙන් කිරීම් සඳහා නිවැරදි ගිණුම්කරන ප්‍රතිපත්තියක් හඳුනාගෙන එය මූල්‍ය ප්‍රකාශනවල |

| | | |
|---|---|---|
| එහෙත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අනුව බොල්ණය හා අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන හෙළිදරව් කර නොතිබුණි. | ණය සඳහා සාමාන්‍ය ප්‍රතිපාදන සපයා නැත.<br>ඔබගේ වාර්තාවේ සඳහන් විශේෂිත අවස්ථාවෙහිදී ගෙවිය යුතු මුළු මුදල රු. 2, 195,000 ක් විය. මෙයින් රු. 300, 000 ක් එකතු කර ඇති අතර ඉතිරි මුදල කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත කපා හරින ලදී. අපි ඉදිරි වසරේ සිට මූල්‍ය ප්‍රකාශන මඟින් ඉහත ප්‍රතිපත්තිය හෙළිදරව් කරන්නෙමු. | හෙළිදරව් කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත සහ උපකරණ යටතේ ප්‍රාග්ධනගත කර සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූණු පෙර දී කුලී පදනම මත කාර්යාලය පවත්වාගෙන යන ලද ගොඩනැගිල්ලේ කාර්යාල වෙන්කිරීම් (Office Refurbishment) සඳහා වූ වටිනාකම රු.මිලියන 1.69 ක් විධිමත් ලෙස ගිණුම්වලින් ඉවත් කිරීම වෙනුවට 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයට නොගෙන මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. | ස්ථාවර වත්කම්, කම්හල් සහ උපකරණ යටතේ දිස්වන කාර්යාල ප්‍රතිසංස්කරණය ලෙස රුපියල් 1,691,092 ක මුදල 2013 ට පෙර මණ්ඩලය විසින් කුලියට ගත් කාර්යාල ගොඩනැගිල්ල වෙන්කිරීම (Partition) සඳහා දරන ලද වියදමකි.<br>මෙම මුදල වර්තමාන ශේෂ පත්‍රයේ ගෙන යාමෙන් අදාළ සම්පූර්ණ ක්ෂය වූ මුදල සමඟින් කිසිදු අර්ථයක් නොමැති අතර එම නිසා එය ඉවත් කරන ලදී. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ සමඟ සැසඳිය යුතු අතර ඉවත් කිරීම් විධිමත් ලෙස ගිණුම්වලින් ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත ඡේදය 319 | සංස්ථාගත කිරීමට පෙර, මණ්ඩලය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක විය.එසේ වුවද 2023 අප්‍රේල් 30 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිෂ්කාශන සහතිකය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් එවකට සමාගමේ ඇවර | මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපි කිහිපයක් ලියා ඇති අතර ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොමැති අතර ප්‍රමාදය අපගේ පාලනයෙන් තොරය. | මණ්ඩලය සෘජුව සම්බන්ධ වී බදු ආපසු ලැබීම් නිරවුල් කර නිෂ්කාශන සහතිකය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොතේ 4.2 ඡේදය | විගණන හා කළමණාකරන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතු අතර, නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා රැස්වීමේ වාර්තා සමඟ එහි නිර්දේශ ඉක්මනින්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කෙසේ වෙතත් මණ්ඩලය කිසිදු දිනක විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | මාසිකව රැස්වන කළමනාකරණ කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් වැදගත් කළමනාකරණ සහ මූල්‍ය තීරණ ගනු ලැබේ. | යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ආයතන පාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොතේ 2.3 ඡේදය | මණ්ඩලය ඵලදායි ලෙස පරිපාලනය සඳහා මානව සම්පත් සහ මූල්‍ය සම්පත් කළමනාකරණයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් නීති රීති සපයන ක්‍රියා පටිපාටි අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් පිළියෙළ කර නොතිබුණි. | මණ්ඩලයේ ක්‍රියාකාරකම් පුළුල් කරන විට පරිපාලන හා මූල්‍ය ක්‍රියා පටිපාටිය පිළිබඳ අත්පොතක් නියමිත වේලාවට සකස් කෙරේ. | රාජ්‍ය ව්‍යාපාර ආයතන පාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය සතුව සම්පත් බැංකුවේ පවතින ජංගම ගිණුම වසර දෙකක කාලපරිච්ඡේදයක් කිසිදු ගනුදෙනුවක් සිදුනොකර, නිෂ්කාර්ය ගිණුමක් ලෙස පවතින අතර එහි ශේෂය රු.මිලියන 0.12 ක් විය. | ගිණුම නැවත ක්‍රියාත්මක කර ඇත. | මණ්ඩලය සතු බැංකු ජංගම ගිණුම් ගනුදෙනු සඳහා භාවිතා නොවන්නේ නම් වසා දැමීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 20,935,761 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,615,588 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,320,173 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බිල්ඩ් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයෙන් ලද රු.35,597,825 ක ආදායම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය 2017 අගෝස්තු 30 වැනි දින සම්පත් බැංකුව සමඟ sampath affinity card පහසුකම් මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ලබා දීමට එම බැංකුව සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර මෙම ගිවිසුම 2021 ඔක්තෝබර් 01 දින අවසන් වී තිබුණි. එසේ වුවද ගිවිසුම දීර්ඝ කිරීමට හෝ නව ගිවිසුමකට ඇතුළත් වීමට මණ්ඩලය කටයුතු කර නොතිබූ බැවින් ලැබිය හැකිව තිබුණු අමතර ආදායමක් අහිමි විය හැකි බවද නිරීක්ෂණය විය. | Sampath Affinity Card ගිවිසුම අලුත් කරන බව දන්වා ඇත. | ගිවිසුම දීර්ඝ කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | මණ්ඩලයේ මාසික ඉදිකිරීම් ප්‍රවෘත්ති ප්‍රකාශනය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමේ සේවාව ලබා ගැනීම සඳහා 2015 මාර්තු 06 වැනි දින සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ANCL) සමඟ වසර පහක කාලයක් සඳහා මණ්ඩලය අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹ ඇති අතර මෙම ගිවිසුම 2020 මාර්තු 06 දින අවසන් වී තිබුණි. එසේ වුවද, අවබෝධතා ගිවිසුම අවසන් වීමෙන් පසු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් පනවා තිබුණු නව ගාස්තු යටතේ මුද්‍රණ ප්‍රකාශන කටයුතු සිදු කරමින් පැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර අඩුම පිරිවැය ගාස්තු හා දායකයන්ට වැඩිම ප්‍රතිලාභ ලැබෙන පරිදි පෘථුල ව්‍යාප්තියක් සහිත ප්‍රකාශකයකු තෝරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ මාසික සමාලෝචන ප්‍රකාශනය මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් ANCL සමඟ නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා කර ඇත. | ඉදිකිරීම් ප්‍රවෘත්ති ප්‍රකාශනය මුද්‍රණය සහ බෙදාහැරීම සඳහා පිරිවැය අඩු හා වැඩි ප්‍රතිලාභ ලැබෙන ප්‍රකාශකයකු ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස | සියලුම පත්වීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කරන බවට සභාව (Council) සහ කළමණාකාර මණ්ඩලය ආරම්භයේදීම ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබුණි. වත්මන් සේවකයින්ගේ සියලුම කොන්ත්‍රාත්තු 2024 | සුදුසුකම් සහිත පලපුරුදු කාර්ය මණ්ඩලයක් ස්ථිර පදනම මත බඳවා ගැනීම මඟින් ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය තහවුරු කර ගත හැකිවේ. |

| | | |
|---|---|---|
| සියලුම නිලධාරීන් සහ සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ අතර එයින් නිලධාරීන් 16 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට 17 දක්වා කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇති අතර EPF සහ ETF ගෙවීම් යාවත්කාලීන වේ. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීමේ පනතේ 11(1) ඡේදය පරිදි කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ, වාර්තාව අදාළ වන වසරට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර ඉදිකිරීම් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත්කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවත් එම වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය කරන ලද ගිණුම් හා වාර්ෂික වාර්තාව අමාත්‍යාංශයට යැවීම පිළිබඳව අප කලකට ඉහත අමාත්‍යාංශයෙන් විමසීමක් කළ විට එය අනවශ්‍ය බව ඔවුන්ට දැනුණි. කෙසේවෙතත් අප මෙම විගණනයෙන් පසු අදාළ වාර්තාවන් යැවීමට කටයුතු කරන්නෙමු. | ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීමේ පනත ප්‍රකාරව මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඡේදය 2.3 අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ නියම කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම | 2001 වර්ෂයේ ආරම්භයේ සිට මණ්ඩලයට රජයෙන් හෝ කිසිදු රාජ්‍ය සංවිධානයකින් අරමුදල් ලැබී නොමැති බැවින් එය රාජ්‍ය ව්‍යවසායක් ලෙස සැලකිය නොහැකිය. එනිසා එම පොදු ව්‍යවසාය චක්‍රලේඛය අදාළ නොවේ. මාසිකව රැස්වන කළමනාකරණ කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් | මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා උපායමාර්ගික සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා එහි උපායමාර්ගික සැලැස්ම සකස් කලයුතු අතර ක්‍රියාකාරී සැලැස්ම සමඟ එක්ව අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික අයවැය ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් පනතේ සඳහන් කාර්යභාරයන් ඉටුකරන ආකාරය දැක්වෙන උපායමාර්ගික සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | වැදගත් කළමනාකරණ සහ මූල්‍ය තීරණ ගනු ලැබේ. | |

**4.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය අනුව මණ්ඩලය විසින් සිදු කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතු වුවද සංවිධානය තුළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරයකු මණ්ඩලය විසින් පත් කර නොතිබුණි. | වාණිජ ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ප්‍රමාණය සලකා බැලීමේදී සහ විශේෂයෙන්ම මණ්ඩලයට රජයෙන් කිසි දිනක මුදල් ලැබී නොමැති බැවින් වෙනම අභ්‍යන්තර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම සහතිකයක් හෝ ලාභදායී නොවන බව කළමනාකාරීත්වයේ අදහසයි. | මණ්ඩලයේ කටයුතු සුමටව කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතුය. |